# උතුරු මැද පළාත් සභාව

## පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අතිරේක පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත් කැඳවීම

උතුරු මැද පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අතිරේක පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුර සඳහා දැනට සේවයේ නියුතු සුදුසුකම් ලත් නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. බඳවා ගැනීමේ සුදුසුකම් :

| අනු අංකය | තනතුරු නාමය | අවශ්‍ය සුදුසුකම් | පුරප්පාඩු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | අතිරේක පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා කෘෂි කාර්මික සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම | 01 |

01.1 අනෙකුත් සුදුසුකම්:

(අ) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය

(ආ) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය

(ඇ) අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 05 කාලය තුළ නියමිත වැටුප් වර්ධක උපයාගත් සතුටුදායක සේවා කාලයක් සහිත හා කිසිදු විනයානුකූල දඬුවමකට යටත් නොවූ නිලධාරියෙකු විය යුතුය.

02. වැටුප් පරිමාණය:

(අ) රා.ප.ච.ලේ. 03/2016 හි SL 1-2016 අනුව රු.47,615-10X1,335-8X1,630-17X2,170-110,895 ක මාසික වැටුප් පරිමාණයක් හිමිවේ.

(ආ) මීට අමතරව තනතුරට හිමි අනෙකුත් වරප්‍රසාද හිමි වේ.

03. බඳවා ගැනීමේ ක්‍රමය:

අදාළ මූලික සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කර ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත ඉහළම ලකුණු ලබාගත්තා අපේක්ෂකයා තනතුර සඳහා බඳවා ගනු ලැබේ.

04. අයදුම්පත තම අත් අකුරින් පැහැදිලිව සම්පූර්ණ කර තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රය, උතුරු මැද පළාත,අනුරාධපුරය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2021.11.08 දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ එවිය යුතුය. අයදුම්පත බහා එවනු ලබන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **අතිරේක පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුර** යනුවෙන් සඳහන් කළ යුතුය.

05. මෙම තනතුර සඳහා තෝරා පත්කර ගනු ලබන නිලධාරියා උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන දිනයකදී තම සේවා ස්ථානයෙන් වහාම නිදහස් වී මෙම පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වෙත සේවයට වාර්තා කළ යුතු අතර, එසේ කිරීමට ඔහු අපොහොසත් වුවහොත් එම අවස්ථාව කුසලතාවයේ ප්‍රමුඛතාවය අනුව ඊළඟ සුදුස්සාට හිමිවනු ඇත.

06. 2014.08.29 දිනැති අංක 1877/52 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවාව පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ කොන්දේසි මෙම බඳවා ගැනීම සඳහා බල පවත්වනු ලැබේ.

07. මේ පිළිබඳ වැඩි විස්තර කාර්යාල වේලාව තුළ උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ දුරකථන අංක 025-2222773 ඇමතීමෙන් ලබා ගත හැක.

08. මෙම පත් කිරීම සම්බන්ධයෙන් උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසන් තීරණය වේ.

**ලේකම්,**
**පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,**
**උතුරු මැද පළාත.**

**2021.10.08**

## ආදර්ශ අයදුම්පත්‍රය

**(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)**

### උතුරු මැද පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අතිරේක පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුර සඳහා බඳවා ගැනීම 2021

01. 1.1 මුලකුරු සමග නම(ඉංග්‍රීසියෙන්) : ....................

1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසියෙන්) ....................

....................

1.3 සම්පූර්ණ නම සිංහලෙන් : ....................

....................

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

1.5 උපන් දිනය: වර්ෂය .......... මාසය .......... දිනය ..........

1.6 2021.11. 08 දිනට වයස: අවුරුදු .......... මාස .......... දින ..........

1.7 ස්ත්‍රී/පුරුෂ භාවය: ....................

2. 2.1 ස්ථිර ලිපිනය: ....................

....................

2.2 රාජකාරි ලිපිනය: ....................

....................

2.3 දුරකථන අංකය(රාජකාරි) ....................

2.4 දුරකථන අංකය(පෞද්ගලික) ....................

2.5 විද්‍යුත් ලිපිනය (පෞද්ගලික) ....................

3. 3.1 මුල්පත්වීමේ දිනය ....................

3.2 සේවය ස්ථිර කළ දිනය ....................

3.3 1 ශ්‍රේණියට උසස් කළ දිනය(ලිපියේ පිටපතක් අමුණන්න) ....................

3.4 දැනට දරන තනතුර හා ඊට පත්වූ දිනය ....................

....................

3.5 2021.11. 08 දිනට සේවා කාලය: අවුරුදු.......... මාස.......... දින..........

04.

**අධ්‍යාපන සුදුසුකම් :**

| අනු අංකය | ලබා ඇති උපාධි/පශ්චාත් උපාධි/ පශ්චාත් උපාධි ඩිප්ලෝමා | විෂය ක්ෂේත්‍රය | ප්‍රතිඵල වලංගු දිනය | විශ්ව විද්‍යාලය/ ආයතනය |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |

05. වෘත්තීය සුදුසුකම්:

| අනු අංකය | වෘත්තීය සුදුසුකම් | වලංගු දිනය | ආයතනය |
|---|---|---|---|
| | | | |
| | | | |

06. අයදුම්කරුගේ ප්‍රකාශය:

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. මෙහි සඳහන් කරුණු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් මා මෙම තනතුරට බඳවා ගැනීමට නුසුදුස්සකු වන බවත්, පත්වීමක් ලැබීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් එම පත්වීම අවලංගු කිරීමට යටත් වන බවත් මා දනිමි.

දිනය:.......... ....................

අයදුම්කරුගේ අත්සන

07. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

මෙම ඉල්ලුම්කරු වන ....................මහතා/මහත්මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ....................වශයෙන් සේවය කරනු ලබයි. පූර්වාසන්න වසර 5 තුළ ඔහු/ඇය මොනයම් ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව සහ ඉහත තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා මුදාහැරිය හැකි/නොහැකි බවත් සහතික කරමි.

දිනය:.......... ....................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

(නිල මුද්‍රාව මගින් සනාථ කළ යුතුය)